# මිහිකත

"ඔබ, අප, මතු පරපුරේ ද
උරුමය වෙනුවෙන්"

## ජාතික ජන බලවේගයේ
# "පරිසර ප්‍රතිපත්තිය"

ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සමස්ත ගොඩබිම වර්ග කිලෝමීටර් 65,610 කි. ඊට අමතරව වර්ග කිලෝමීටර් 18,060 ක සාගර කලාපයක්, වර්ග කිලෝමීටර් 19,620 යාබද සාගරික කලාපයක් හා වර්ග කිලෝමීටර 4,37,400 ක අනන්‍ය ආර්ථික සාගර කලාපයක් ද නියෝජනය කරයි.

භූවිෂමතාව අනුව මුහුදු මට්ටමේ සිට අඩි 300 දක්වා ප්‍රදේශය වෙරළබඩ කලාපය ලෙසත්, අඩි 300 - 1000 සහ අඩි 1000 ට වැඩි ප්‍රදේශ කඳුකර ප්‍රදේශ ලෙසත් පවතී. වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 900 සිට මිලිමීටර් 5000 ට වැඩි අගයක් දක්වා වෙනස් වේ. ප්‍රධාන ගංගා ද්‍රෝණි 103 කින් ද කුඩා ගංගා හා ද්‍රෝණි 94 කින් ද ජල සම්පත පෝෂිතය. පරිසර පද්ධති අතර අන්තර් සම්බන්ධතා හේතුවෙන් ශ්‍රී ලංකාවට අයත් මුළු භූමි ප්‍රමාණයම තනි පරිසර පද්ධතියක් ලෙස සැලකිය හැකිය. ගුණාත්මක පාංශු ස්තරයක්, හඳුනාගත් සුපුෂ්පික ශාක හා සත්ව විශේෂ අතරින් 25%-30% ත් අතර ප්‍රමාණයක් ආවේණික විශේෂ ලෙසත් අප සතුව පවතී.

එසේ වුව ද මේ දක්වා ආර්ථික සංවර්ධනයක් සහිත පරිසර හිතකාමී මානව සමාජයක් නිර්මාණය කර ගැනීමට අප අපොහොසත්වී ඇත. පාරිසරිකව බලපාන මහාද්වීපික තටාකයේ දළ වශයෙන් ශ්‍රී ලංකාව මෙන් 20 ගුණයකට වඩා වැඩි සාගර භූමි ප්‍රමාණය නිරවුල් කර ගැනීමට ද වසර 20කට වැඩි කාලයක් තුළ නොහැකි වී ඇත. ජාත්‍යන්තර ප්‍රඥප්තීන් සැලකිය යුතු ප්‍රමාණයකට අපගේ එකඟතාව පලකර තිබීම හා රටේ පරිසරයට අදාළ නීති 100 කට වැඩි සංඛ්‍යාවක් තිබියදී පවා පරිසර හිතකාමී ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අප අපොහොසත් වී ඇත. නිවැරදි භූමි පරිහරණ සැලසුම් ක්‍රියාවට නොනැගීම හේතුවෙන් මතුපිට පස් ස්තරය, ඛාදනයට ලක්වීම මෙන්ම නායයාම් හේතුවෙන් නිසරු පොළවක් බවට පත්වෙමින් පවතී. නිසි ජල කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් උග්‍ර ජල හිඟයකටත්, තවත් විටක අතිරික්ත ජලයෙන් පීඩාවට ලක්වීමටත් සිදුව ඇත. වසර 30 ක කෙටි කාලයක දී වාෂ්පීකරණය දෙගුණ වීමත්, ජලධර විනාශ වීම

හා එහි පැවැත්මට සෘජුව බලපාන වෙනත් පාරිසරික සාධක විනාශවීමත් ප්‍රධාන ගැටලු ලෙස පවතී.

ජාතික ජන බලවේගයේ පරිසර ප්‍රතිපත්තිය සමාජ ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාවය රැකෙන පරිදි ස්වාභාවික සම්පත් භාවිතය, තිරසර කළමනාකරණයේදී සහභාගීත්ව ප්‍රවේශය, දේශගුණික විපර්යාසවලින් ඇතිවන පීඩාවන් අවම කිරීම, දැනුම, කුසලතා, ආකල්ප හා මනෝභාවයන් මගින් ගොඩනැගෙන නිරෝගී ජන සමාජයක් සහ සමතුලිත පරිසරයක් උදෙසා ප්‍රමුඛතාවය ලබා දේ.

# දැක්ම

මිනිස් ප්‍රජාව ප්‍රමුඛ සියලු ජීවීන්ගේ යහපැවැත්ම තහවුරු කරන තිරසර පරිසරයක්

දිළිඳුකම පිටුදැකීම සහ මානව හා අනෙකුත් ජීවීන්ගේ (වර්තමාන හා අනාගත) යහපැවැත්ම උදෙසා පරිසර කළමනාකරණයට රජයේ කැපවීම, අප ගොඩනගන ජාතික පාරිසරික ප්‍රතිපත්තියේ මූලික අවශ්‍යතාවය ලෙස සලකන අතර, තිරසාර සංවර්ධන රාමුවක් තුළ රටේ නිවැරදි පරිසර කළමනාකරණයක් සහතික කරගැනීමට බලාපොරොත්තු වේ. සමස්ත පරිසර පද්ධතීන් සුරැකීම හා කළමනාකරණයට මාර්ගෝපදේශයක් සැපයීමට අපේක්ෂා කරන අතර, සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ද පුද්ගලයන් ද මෙහි දැක්මට අනුව මෙහෙයවනු ලැබේ.

# මූලධර්ම

- **පාරිසරික යුක්තිය සහ සාධාරණත්වය:** සෑම පුරවැසියෙකුගේම වගකීමක් වනුයේ පරිසරය ආරක්ෂා කිරීම සහ සියලු ප්‍රජාවන්ගේ අයිතිය තහවුරුවන පිරිපුන් පරිසරයක් ඇති කිරීමය. එහි ප්‍රතිලාභ ලෙස මානව හා ජීවීන්ගේ අනාගත පැවැත්ම තීරණය කරනු ඇත. ස්වභාවික සම්පත් භුක්ති විඳිමේදී සාධාරණ පරිභෝජනය පවත්වා ගැනීම තුළින් සියලු ජීවීන්ගේ අනාගත පැවැත්ම තහවුරු කිරීම.

- **පරිසරය සහ සංවර්ධනය අතර සමබරතාව:** සංවර්ධන ව්‍යාපෘතිවල දී පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සහ සම්පත් තිරසර පද්ධතියක පැවැත්ම උදෙසා කාර්යක්ෂමව භාවිතයට ගැනීමට සහතික වීම.
- **තිරසර සම්පත් භාවිතය සහ පූර්වාරක්ෂක ක්‍රමවේදය:** පාරිසරික සම්පත් භාවිත කිරීමේ දී ඒවායේ ගුණාත්මක තත්ත්වය හා වටිනාකම අඩු නොවනසේ හා අනාගත මානව පැවැත්ම සුරක්ෂිත වන අයුරින් භාවිතයට ගැනීම. කිසියම් ක්‍රියාකාරකමක් නිසා සම්පූර්ණ වශයෙන් තක්සේරු කළ නොහැකි පාරිසරික අවදානමක් පවතිනවිට එය විසඳීමට පෙර එම ක්‍රියාකාරකම තහනම් කිරීමට හෝ සීමා කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
- **පරිසර පද්ධති ප්‍රවේශය:** පාරිසරික සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණයේ දී ඒකාබද්ධ පරිසර පද්ධති ප්‍රවේශය භාවිතයට ගැනීම.
- **ආයතනික සම්බන්ධීකරණය සහ මහජන සහභාගිත්වය:** පරිසර ආරක්ෂාව හා කළමනාකරණයේ දී සහභාගිත්ව ප්‍රවේශය වැඩිදියුණු කිරීම.
- **දූෂකයා ප්‍රතිපූර්ණය:** (Polluter-Pay-Principle) පරිසරයට අපද්‍රව්‍ය එක්කරන කවරෙකු වුවද එම අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මූලික වගකීම ඔහු විසින් දැරිය යුතුවීම.
- **පාරිසරික යහපාලනය:** පරිසර නීති, පාරිසරික කළමනාකරණ ආයතන, විනිවිද බව, වගවීම, මානව අයිතීන්වලට ගරු කිරීම තහවුරු කෙරෙන රාජ්‍ය පාලන ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම.
- **ප්‍රජාව සවි බලගැන්වීම:** පරිසර පද්ධති සමඟ ජීවත්වීමට ප්‍රජාවට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප හා වටිනාකම්වලින් පිරි සංස්කෘතියක් ගොඩනගමින් තිරසර පැවැත්ම තහවුරු කිරීම.
- **පාරිසරික ආරක්ෂාව:** මානව ක්‍රියාකාරකම් හා ස්වභාවික ක්‍රියාවලින් පැන නගින පාරිසරික උවදුරුවලින් පරිසර පද්ධති ආරක්ෂා කිරීම.

# අරමුණු

- නීරෝගී සමතුලිත පරිසරයක් හා සමාජ දේහයක් තහවුරු කිරීම උදෙසා නිවැරදි භූමි පරිහරණ ක්‍රමවේද හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- තිරසර පරිසරයක පැවැත්ම තහවුරු කෙරෙන දියුණු ජල පරිභෝජන ක්‍රමවේද හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- සාගරයේ තිරසර පැවැත්ම තහවුරු කෙරෙන සාගර හා වෙරළ සම්පත් පරිභෝජන ක්‍රමවේද හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- මිනිසා ප්‍රමුඛ කරගත් සත්ව හා ශාක ප්‍රජාවන්ගේ යහපැවැත්ම සාක්ෂාත් කෙරෙන වායුගෝලීය තත්වයන් පවත්වාගැනීම උදෙසා තිරසර ක්‍රමවේද හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- පරිසරය හා අදාළව අන්තර්ජාතික සම්මුතීන් හා පිළිගැනීම්වලට අනුගතව ජාතික නීති පද්ධති සමාලෝචනය කරමින් යාවත්කාලීන කිරීම, සකස් කිරීම සහ ජනප්‍රජාව දැනුවත් කිරීම, එම අරමුණු සාක්ෂාත් කරගැනීමට අවැසි නව නීති හා රෙගුලාසි සැකසීම.
- විවිධ ජෛව පරිසර පද්ධතිවල වටිනාකම් දුලබතාව, ව්‍යාප්තිය, අන්තර් සම්බන්ධතාව විද්‍යාත්මක ක්‍රම ඔස්සේ අධ්‍යයනය කරමින් තිරසර සංරක්ෂණ ක්‍රම හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම හා තහවුරු කිරීම.
- සියලු පරිසර පද්ධතිවල පවතින අන්තර් සම්බන්ධතාවයන් විද්‍යාත්මක ක්‍රමවේද හා සහභාගීත්ව ක්‍රමවේද ඔස්සේ හඳුනාගනිමින් සමාජ ආර්ථික සංවර්ධනය සඳහා භාවිත කිරීම සහ පාරිසරික යහපැවැත්ම තහවුරු කිරීම.
- නිශ්චිතව හඳුනාගත් ගෙවතු ආශ්‍රිත මතුපිට සම්පත් පරිහරණය සඳහා (සංරක්ෂණයට ප්‍රමුඛත්වය දෙමින්) ලිහිල් ක්‍රමවේද, ප්‍රමිතීන් හා නීතිමය ප්‍රතිපාදන හඳුන්වාදීම සහ භාවිතයට ගැනීම. ගෙවතු උද්‍යාන පවත්වා ගැනීමේ දී සහ නඩත්තු කිරීමේ දී උපරිම පාරිසරික වාසි සහ ආර්ථික වාසි අත්වන ආකාරයට පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ, ප්‍රමිතීන් සහ නීතිමය ප්‍රතිපාදන හඳුන්වාදීම හා භාවිතයට ගැනීම.
- ගෘහස්ථ, නාගරික හා කාර්මික අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීමේදී පරිසරයට සිදුවන හානි මෙන්ම ජනනය අවම කළහැකි තාක්ෂණික ක්‍රමවේද භාවිත කිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීකරණය තුළින් එය සම්පතක් බවට පරිවර්තනය කරගැනීම.

- අන්තර් පාරිසරික ජෛව ක්‍රියාකාරිත්වයන්වල ස්වභාවය හා වටිනාකම් හඳුනාගැනීම තුළින් පරිසර සම්පත් තිරසර ලෙස භාවිත කිරීමේ ක්‍රමවේද වෙත යොමුවීම.

# ක්‍රියාකාරකම්

නිවැරදි භූමි පරිහරණ ක්‍රමවේදත ශ්‍රී ලංකාවේ පවතින ව්‍යුහාත්මක පිහිටීමේ සුවිශේෂිතා මෙන්ම වර්ෂාපතනයේ විවිධත්වය, භූමිය රසායනික හා භෞතික වෙනස්කම් සහිත මීටර හතරක පමණ ගැඹුරු පාංශු ස්තරයකින් සමන්විත වීම සැලකිල්ලට ගෙන මෙම ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් වෙත ප්‍රවේශවීම සිදුවේ. ක්ෂුද්‍රජීවී ක්‍රියාවලිය ඉතා කාර්යක්ෂම, සංවේදීතම හා ලිහිල් කාබනික ද්‍රව්‍යවලින් සමන්විත කොටස මෙම ස්තරයේ ඉහළම ස්තරය වන අතර එම ස්තරය වායුගෝලයේ තුලිතතාව මෙන්ම පසේ සශ්‍රීක බව තීරණයවන කොටස ලෙස හඳුනා ගනිමු. තවද මෙම ස්තරය වායුගෝලය හා පොළොව අතර අන්තර් සම්බන්ධය පවත්වාගනු ලබන ඉතා වැදගත් ස්තරය වේ. විවිධ මානව ක්‍රියාකාරකම් මෙන්ම ස්වාභාවික භූ පිහිටීම හේතුවෙන් මෙම ස්තරය දැඩි ඛාදනයට ලක්වීමෙන් බොහෝ පාරිසරික පද්ධති මෙන්ම කෘෂිකාර්මික කටයුතු ද මහත් ව්‍යාකූලත්වයට ලක්වී ඇත. තවද භූමිය මත හඳුනාගෙන නෛතිකව තහවුරුකළ මෙන්ම හඳුනාගෙන නෛතිකව තහවුරු නොකළ හා එසේ හඳුනානොගත් අධි සංවේදී පාරිසරික කාලාපවල පැවැත්ම දැඩි අනතුරකට භාජනය වෙමින් පවතී. විද්‍යානුකූල නිවැරදි භූමි පරිහරණ සැකැස්මක් භාවිතයට නොනැගීම තුළ විවිධ වූ පාරිසරික ගැටලු නිර්මාණය වී ඇත.

# ක්‍රියාමාර්ග

## සංවේදි පාරිසරික පද්ධති භූමි භාවිතාව

- දැනට විද්‍යානුකූලව හඳුනාගෙන ප්‍රකාශයට පත්කර ඇති පාරිසරිකව දැඩි සංවේදී කලාප හා සංවේදී කලාප නිශ්චිතව තහවුරු කිරීම.
- දැනට මානව ක්‍රියාකාරකම් සක්‍රීය ප්‍රදේශවල තිබිය හැකි අධි සංවේදී හා සංවේදී පරිසර කලාප විද්‍යාත්මකව සහ ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේද ඔස්සේ හඳුනාගෙන ප්‍රකාශයට පත්කර තහවුරු කිරීම.
- අභිනවයෙන් හඳුනාගනු ලබන අධි සංවේදී හා සංවේදී පරිසර කලාපවල ජීවත්වන ජන ප්‍රජාවගේ සාම්ප්‍රදායික ක්‍රියාකාරකම්වලට බාධාවක් සිදුනොවන පරිදි සහ එම ජනප්‍රජාව උක්ත පරිසරයේම කොටසක් ලෙස හඳුනාගනිමින් සංරක්ෂණය කිරීම සඳහා ක්‍රමවේද සැකසීම.

## කෘෂිකාර්මික භූමි භාවිතාව

- පහත් බිම් හා ගොඩබිම් නිශ්චිතව හඳුනාගැනීම, (රසායනිකව හා භෞතිකව) සිතියම්ගත කිරීම සහ ලේඛනගත කිරීම.
- සහභාගිත්ව ප්‍රවේශ ක්‍රමවේද භාවිතයෙන් උක්ත භූමි පරිහරණයේ දී සිදුවන පාරිසරික හානි අවම කිරීමේ උපායමාර්ග හඳුනා ගැනීම.

## කාර්මික භූමි භාවිතාව

- අධි දූෂ්‍යකාරක කර්මාන්ත, මධ්‍ය දූෂ්‍යකාරක කර්මාන්ත හා අඩු දූෂ්‍යකාරක කර්මාන්ත සඳහා සුදුසු කාර්මික භූමි කලාප හඳුනාගැනීමග

## නිවාස සඳහා භූමි භාවිතාව

- සෑම පවුලකටම නිවසක් ඉදිකර ගැනීම සඳහා  පාරිසරික අවකාශයක් තිබිය යුතු බව පිළිගැනීම සහ නිවාස ඉදිකිරීම් සඳහා නිශ්චිත භූමි ප්‍රදේශ පාරිසරිකව හඳුනාගැනීම.

**ඛනිජ කැණීම් සඳහා භූමි භාවිතාව**

- ඛනිජ කැණීම් හා නිස්සාරණ කටයුතුවලදී පිහිටීමේ ස්වභාවය සහ අපද්‍රව්‍ය පරිසරයට එක්වීම යන කරුණුවලට අවධානය යොමුකරමින් ගොඩබිම්, ජල, වායු පරිසරයන්ට සිදුවන හානි අවම වූ තිරසර භාවිත ක්‍රමවේදයක් සහතික කිරීම.
- දැනට හඳුනාගත් හා අනාගතයේ දී හඳුනාගනු ලබන ඛනිජ සම්පත් පිහිටි භූමි තිරසර ආර්ථික මෙහෙයුම්වලට භාවිතා කිරීම සඳහා ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම.
- ඉදිකිරීම් සඳහා භාවිත කෙරෙන ඛනිජ ද්‍රව්‍ය (ගල්, වැලි, පස්) පිහිටි ප්‍රදේශවල වාසය කරන ජනතාවගේ සහභාගීත්වය සහිතව ඔවුනට උපරිම ආර්ථික ප්‍රතිලාභ සහතිකවන පරිදි වගකීම් හා වගවීම් ඔවුන් වෙත පවරමින් නිත්‍යානුකූල හා තිරසර ක්‍රමවේද ඔස්සේ භාවිතයට ගැනීම.
- දැනට හඳුනාගෙන ඇති හා භාවිතයට ගැනෙන ඛනිජ නිධි හා අනාගතයේ හඳුනාගැනෙන ඛනිජ නිධි ආර්ථික ක්‍රියාවලියට භාවිතයට ගැනීමේදී වියදම් වාසි විශ්ලේෂණය (Extended cost-benefit analysis) සහ පරිසර ඇගයීම් සහිතව භාවිතයට ගැනීම තහවුරු කිරීමග
- තිරසරව ඛනිජවල උපරිම ආර්ථික ප්‍රතිලාභ පුරවැසියන්ට අත්පත් වන පරිදි කැණීම් සිදුකිරීම.
- ඉදිකිරීම් ද්‍රව්‍ය කැණීම්වලදී සිදුවන දැඩි පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා ආදේශකයන් හඳුන්වාදීම හා පර්යේෂණ දිරිගැන්වීම සහ ඉදිකිරීම් සඳහා අවසර ලබාදීමේදී ආදේශක ඉදිකිරීම් ද්‍රව්‍ය සහිතව සිදුකරනු ලබන ඉදිකිරීම් දිරිගැන්වීමට කටයුතු කිරීම.

## ජල පරිභෝජන ක්‍රමවේද

ශ්‍රී ලංකාවේ සුවිශේෂී භූ පිහිටීම හේතුවෙන් මෝසම් හා අන්තර් මෝසම් වැසි කාල පරිච්ඡේදයන් හතරකින් ලැබෙන ජල ප්‍රමාණය අක්කර අඩි මිලියන 89 ක් වේ. මෙම ජල ප්‍රමාණය ස්වාභාවිකව කළමනාකරණය වීම සඳහා විවිධ දිගින් යුත් ගංගා 103 ක් හා එයට අදාළ වූ ගංගා ද්‍රෝණීන් ද වෙරළ ආශ්‍රිතව කුඩා ගංගා 94 කට අදාළ ගංගා ද්‍රෝණිවලින් ද සමන්විතය. ලැබෙන සමස්ත ජල ප්‍රමාණයෙන් තෙත් කලාපයෙන් 60% හා වියළි කලාපයේ 40% ක් ගංගාවලින් සාගරයට ගලා බසී. ඉතිරි ජල ප්‍රමාණය මතුපිට වූ වර්ග කිලෝමීටර් 2905 වූ ජලාශවල ද, පාංශු ස්තරය තුළ ද, පාෂාණවල වූ කුස්තුර හා පැළුම් තුළ ද භූගත ජලය ලෙස ගබඩා වේ. මානව පරිභෝජනය සඳහා දැනට ඝන මීටර් බිලියන 13 භාවිතාවන අතර එයින් 88% ක් කෘෂිකර්මාන්තය සඳහාත් 6% බැගින් ගෘහස්ථ පරිභෝජනයටත් කාර්මික කටයුතු සඳහාත් පරිභෝජනය කෙරේ.

එක් එක් ගංගා ද්‍රෝණිවල, වැසි වනාන්තර හා අනෙකුත් වනාන්තර මෙන්ම තෘණ භූමි හා මතුපිට පස් ස්තරය විනාශවීම හේතුවෙන් මෝසම්වලින් ලැබෙන වර්ෂාපතනය අඩුවීමත්, භූගත ජලය ලෙස අභ්‍යන්තරයට කාන්දුවීම අඩුවීමත්, මතුපිටින් ගලායන ජල ප්‍රමාණය වැඩිවීමත් වසර 30 ක කාල පරාසය තුළ ජල වාෂ්පීකරණය දෙගුණවීමත් ජල අර්බුදය නිර්මාණය වීමේ ප්‍රධාන සාධකය. එමෙන්ම භූගත ජලය ගබඩා කරගනු ලබන වැලි සහිත ජලධරයන් විනාශ කිරීමත්, අවිධිමත් භූමි පරිහරණය හේතුවෙන් සිදුවන පාංශු හායනයත් ජල අර්බුදය තවත් තීව්‍ර කරයි.

බොහෝ කලපුවල ජලයේ තිබියයුතු ලවනතාවට දැඩි බලපෑම් එල්ලවීම හේතුවෙන් කලපු හා මුහුදු ජීවීන්ගේ බෝවීමට හා පැවැත්මට දැඩි බලපෑම් එල්ලවී ඇත. යාපනය අර්ධද්වීපයේ මෙන්ම බොහෝ ගංගා දිගේ රට අභ්‍යන්තරයට මුහුදු ජලය කඩාවැදීම් හේතුවෙන් විවිධ වූ ජල අර්බුද නිර්මාණය වී ඇත.

## ක්‍රියාමාර්ග

මෘදු ජලය (වැසි ජලය, මතුපිට ගලායන ජලය, ජලාශ හා භූගත ජලය)

- ගංගා ද්‍රෝණි හා මධ්‍යම කඳුකරයේ වැසි ජලය ගබඩා කර ගත යුතු අවම ජලධර ප්‍රමාණය ගණනය කරන අතර, භූමිය මතුපිට සහ අභ්‍යන්තර පාෂාණ තුළ ඇති ජලධරයන් ප්‍රතිපූර්ණය කිරීම උදෙසා විද්‍යානුකූල ක්‍රමවේදයන් සකස් කිරීමග

- ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍ර අධ්‍යයනයකින් පසු මැනුම් කටයුතු කොට, ගැසට් කර සංරක්ෂණය කිරීම.
- ජනාවාස ඔස්සේ ගලායන ගංගාවල පළමු හා දෙවන ශ්‍රේණියේ ජල මාර්ගවලට (ඇළ හා දොළ මාර්ග) සිදුවන ගෘහස්ථ බලපෑම් වන මළ අපද්‍රව්‍ය, සෘජු සේදීම් කටයුතු, පොලිතීන් හා ප්ලාස්ටික් බැහැර කිරීම් ඇතුලු සියලු ආකාරයේ අපද්‍රව්‍ය මුදා හැරීම්වල සෘජු බලපෑම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේද මඟින් වැළැක්වීමට කටයුතු කිරීම.
- එල්ලංගා පද්ධති සක්‍රීය කළ හැකි ජලපෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි සක්‍රීය කිරීමෙන් ක්ෂණික ගංවතුරෙන් හා නියඟයෙන් සිදුවන බලපෑම අවම කිරීමත්, ගංගාවලට හා ජලාශ වලට රොන්මඩ හෙවත් අවසාධිත එකතුවීමත්, පාංශු ඛාදනයත් අවම කිරීම හා සුදුසු එල්ලංගා පද්ධති ලෝක උරුම බවට පත්කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමග
- ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ ඉතිහාසය සැකැස්මේ සුවිශේෂීතාව වන වාරි ශිෂ්ටාචාරය අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීම අරමුණු කරගෙන විධිමත් ජල හා වාරි කෞතුකාගාරයක් නිර්මාණය කිරීම.
- මතුපිට හා භූ අභ්‍යන්තර ජලය දූෂණයට ලක්වන සියලුම මූලාශ්‍ර හඳුනාගෙන විද්‍යානුකූල වූ විධිමත් ක්‍රම මගින් ජලයේ පවිත්‍රතාව තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ලබා ගෙන ජල දූෂණයට හේතුකාරකවන සාධක සීමා කිරීමට හා ඉවත් කිරීමට කටයුතු කිරීමග
- කාර්මික, කෘෂිකාර්මික හා සේවා ස්ථානවල භාවිත කර පරිසරයට මුදාහරිනු ලබන අපජලය නිවැරදි විද්‍යානුකූල ක්‍රමයකින් පරිසරයට බැහැර කිරීමට සුදුසු ක්‍රම හඳුන්වාදීම සහ නියාමනය විධිමත් කිරීම.
- ජල පරිහරණය සඳහා විද්‍යාත්මක පාරිසරික ජල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- මානව අවශ්‍යතා සඳහා භාවිත ජලය තුළ පවතින ජෛව රසායනික අන්තර්ගතයන් පරීක්ෂාවට ලක්කිරීම තුළින් මානව සෞඛ්‍ය යහපැවැත්ම තහවුරු කිරීම.
- අභ්‍යන්තර තෙත්බිම්වල ජලයේ ගුණාත්මකබව හඳුනාගෙන දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ එම දත්ත කළමනාකරණ කටයුතු සඳහා යොදා ගැනීම.

- ජල මූලාශ්‍රවල පැවැත්මට දැඩි අහිතකර බලපෑම් ඇතිවන කැළෑ ගිනි තැබීම් පාලනය කිරීම සඳහා පවතින නීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.

මුහුදු ජලය හා කලපු ජලය

- රට පුරා ඉදිකර ඇති ලවන බාධක ආශ්‍රිත ගැටලු හඳුනාගනිමින් ප්‍රතිසංස්කරණය කර නිසි ආකාරයෙන් නඩත්තු කිරීම හා විද්‍යාත්මක පදනමකින් හඳුනාගනු ලබන ප්‍රදේශ හා කලපු ආවරණයවන පරිදි ලවන බාධක ඉදිකිරීම.
- කලපු හා තෙත්බිම් ආශ්‍රිතව හඳුනාගත් රම්සා තෙත්බිම්වල තිරසර පැවැත්ම තහවුරු කරමින් භාවිතයට ගැනෙන අතර නව රම්සා තෙත්බිම් හඳුනාගෙන ඒවා සංරක්ෂණය කිරීම.
- පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධනය, සාගර හා කලපු ආශ්‍රිත ශාඛ හා සත්ව වර්ධනයට පියවර ගැනීම.
- තෙත්බිම් හා කලපුවල ජලයේ රසායනික හා භෞතික සංඝටකවල මූලික දත්ත පද්ධතියක් සැකසීම. කලපු හා තෙත්බිම්වල තිබිය යුතු ජල පරාමිතීන් පවත්වා ගැනීම සඳහා කඨින හා මෘදු ජල තුලිතතාව රැක ගැනීමග
- ඉහත ජල දූෂණ වැළැක්වීම සඳහා පවතින හා අභිනවයෙන් හඳුන්වා දෙනු ලබන නීති අණපනත් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම්, ආකල්ප, පූර්වාදර්ශ මහජනතාවට ලබාදීම, සියලු ජල ප්‍රභවයන්ගේ ගුණාත්මකබව තහවුරු කෙරෙන පදනම් ජල සිතියමක් සැකසීම.

## සාගර හා වෙරළ සම්පත්හි තිරසර පැවැත්ම

සමස්ත සාගර කලාපය හා ඉන් ඔබ්බට ඇති අතිමහත් ශාඛ හා සත්ව මෙන්ම අධි සාන්ද්‍ර ඛනිජ නිධි හිමි වුව ද ඒ පිළිබඳ නිසි අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නොමැත. භාවිතයට නොගත් මෙවැනි සම්පතකට හිමිකම් කීව ද එය නිසි

ලෙස සීමා නිර්ණය කර නැත. වෙරළ ආශ්‍රිතව ක්‍රියාත්මක වන විවිධ වූ මානව ක්‍රියාකාරකම් මගින් සාගරය හා ගොඩබිම අතර විශාල අස්ථායිතාවක් නිර්මාණය වී තිබේ. මානව ක්‍රියාකාරීත්වය හේතුවෙන් සහ සාගරයට මුදාහරින අපද්‍රව්‍ය හේතුවෙන් ද සාගරය සහ වෙරළ කලාපය විශාල අභියෝගයකට මුහුණපා ඇත. එමෙන්ම  මුහුදු ජල මට්ටම  ඉහළ යෑම ද අප හමුවේ පවතින ප්‍රබල අනතුරකි.

## ක්‍රියාමාර්ග

- වෙරළ තීරයට හෝ සාගරයට සෘජුව හෝ වක්‍රව අපද්‍රව්‍ය බැහැර කිරීම පූර්ණ ලෙස නතර කිරීම.
- ගොඩබිම හා සාගරයේ පරිසර පද්ධති අතර අන්තර් සම්බන්ධය ඇති කරන වෙරළ කලාපයේ අධි සංවේදී පරිසර පද්ධති හඳුනාගෙන එම පරිසර පද්ධති සුරක්ෂිත කිරීමග
- වෙරල හා කලපුවල සංරක්ෂණ සීමාව විද්‍යානුකූල ව තීරණය කර සංරක්ෂණය කිරීම.
- මත්ස්‍ය සම්පත ඇතුලු ගැඹුරු මුහුදේ පවතින ස්වභාවික සම්පත් භාවිතයට ගැනීමට හා එම සම්පත් සුරක්ෂිත කිරීම වෙනුවෙනුත්, සාගර දූෂණය අවම කිරීම වෙනුවෙනුත්, ජාත්‍යන්තර නීතිවලට හා සම්මුතීන්වලට සමගාමීව පාරිසරික නීති පද්ධතියක් සැකසීම.
- මුහුදු ජීවීන් ස්වභාවිකව අධික ලෙස අභිජනනයවන කොරල්පර, ගල්පර හා මුහුදු තෘණ භූමි හඳුනාගෙන සංරක්ෂණය කිරීම හා වර්ධනය වීමට ඉඩප්‍රස්ථා සැලසීම.
- පෞරාණික ගිලුණු  මුහුදු යාත්‍රා අයත් ප්‍රදේශ අතරින් සුදුසුම කීපයක් හඳුනාගෙන මුහුදු කෞතුකාගාර ලෙස නම්කොට සංරක්ෂණය කර, පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.
- වෙරළ ආශ්‍රිතව ඇති ඛනිජ සම්පත් හඳුනාගෙන කැණීම් සිදුකළ හැකි ප්‍රමාණයන් නිශ්චය කර පරිසර හිතකාමීව තිරසර ලෙස කැණීම් සිදුකිරීමට පියවර ගැනීම.

- රටට සුභදායකවන අයුරින් අන්තර්ජාතික නීති හා ප්‍රඥප්තීන් සමාලෝචනය සහ රටේ නීති සමාලෝචනය කරමින්, නැවත සකසමින් නාවික ගමනාග මන හා වරායන්හි කසළ බැහැර කිරීම නිසා සිදුවන සාගර දූෂණය අවම කිරීමට කටයුතු කිරීම.
- සමුද්‍රයේ දී සිදුවන පාරිසරික හානි අවම කිරීම සඳහා සමාජයේ සියලු ස්තරවල  දායකත්වය ලබාගැනීමට කටයුතු කිරීම, අදාළ නීතිරීති සම්බන්ධයෙන් දැනුවත් කිරීම, අදාළ ආයතනවල සහභාගිත්වයෙන් හදිසි සූදානම් සැලැස්මක් සකස් කිරීම.

## වායුගෝලීය තත්වයන් කළමනාකරණය

වර්තමානයේ, ජීවයේ පැවැත්ම සඳහා වායු සංඝටකවල පැවතියයුතු අනුපාතයන් තිරසර ලෙස පවත්වා ගත හැකි දූපතක් ලෙස ශ්‍රී ලංකාව සැලකිය හැකිය. ඕසෝන්වලින් අනූන වෙරළ තීරයත්, ඔක්සිජන් බහුල ඇතැම් ප්‍රදේශ හා ක්ෂණික වර්ධනය හේතුවෙන් වැඩි ඔක්සිජන් ප්‍රමාණයක් වායු ගෝලයට ලබාදීමේ හැකියාව සහිත වෘක්ෂවලින් බහුලවීමත්, භූමිය ආවරණය වී ඇති තෘණ හා සක්‍රිය ක්ෂුද්‍රජීවී ක්‍රියාවලිය සහිත මතුපිට සාරවත් පසත්, හිතකර වායුගෝලයක් පවත්වා ගැනීමට ඉවහල්වේ. මෙවැනි සාධනීය පරිසරයක් තිබියදී මහනුවර, රත්නපුර වැනි වායු දූෂණය අධික නගර බිහිවීම මෙන්ම අසල්වැසි රාජ්‍යන්ගේ වායු දූෂණය හේතුවෙන් අප රටේ කොළඹ ඇතුලු නගර කීපයක වායු දූෂණය ඉහළ යාමත් සිදුවෙමින් පවතී. එසේම ප්‍රකාශ රසායන ධූමිකාව නිර්මාණය වෙමින් මිනිස් ජීවිත අවධානමකට ලක්වෙමින් පවතී.

## ක්‍රියාමාර්ග

- වායුගෝලයට විමෝචනය වන දූෂ්‍යකාරක වායු වර්ග එම ස්ථානයේදීම අතුරු නිශ්පාදන බවට පත්කිරීමේ හෝ බැහැරකරලීමේ නව තාක්ෂණය හඳුන්වාදීම හෝ විමෝචනය සිදුනොවන ක්‍රමවේදවලට ප්‍රවිෂ්ට වීම දිරිගැන්වීමට කටයුතු කිරීම සහ පර්යේෂණ සිදු කිරීම.
- වායුගෝලය තුළ ප්‍රකාශ රසායන ධූමිකාව නිර්මාණය වෙමින් මිනිසාගේ පැවැත්ම අභියෝගයට ලක්කරමින් වායු දූෂණය උච්ච අවස්ථාවකට ළඟාවී ඇති නගර හඳුනා ගෙන  නව තාක්ෂණික, ජෛව ක්‍රම භාවිතයෙන් එම ධූමිකාව ඉවත්කිරීම .

- සියලු මිනිස් ක්‍රියාකාරකම් නිසා වායුගෝලය විමෝචනය වන වායු වර්ගයන් හා ක්ෂුද්‍ර ඝන අංශු පිළිබඳව විගණනයක් සිදු කර එම තොරතුරු මහජනතාව වෙත ලබාදීමග.
- එදිනෙදා ගෘහස්ථ කටයුතු සඳහා ප්ලාස්ටික් සහ පොලිතීන් භාවිතය අවමකර ගැනීම සඳහා දිරිගැන්වීම, දැනුවත් කිරීම සහ විකල්ප හඳුන්වාදීම, නිවසේ එකතුවන ප්ලාස්ටික් සහ පොලිතීන් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියකට යොමු කිරීම මගින් විවෘත ගිනි තැබීම වළක්වාලීමට කටයුතු කිරීම.
- අසල්වැසි රාජ්‍යන්ගේ වායුගෝලීය දූෂණය හේතුවෙන් රටට සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීම.
- වායුගෝලයේ හරිතාගාර වායු අවශෝෂණ හා විමෝචන ක්‍රියාවලිය සමතුලිතතාවයේ පවත්වා ගැනීම සඳහා කාබන් තිර කිරීමේ උපරිම හැකියාව ඇති සහ ක්ෂණික වර්ධනයක් ඇති, එමෙන්ම පාරිසරිකව යෝග්‍ය දැවමය ශාක වගාවන් හඳුන්වාදෙන අතර එමගින් වාණිජ නිශ්පාදන කරන කර්මාන්ත දිරිගැන්වීම
- ශබ්ද සහ දෘශ්‍ය විමෝචන මගින් සිදුවන දූෂණ මට්ටම් මැන බැලීම හා තක්සේරු කිරීම, ඊට අදාළ ආයතනික ධාරිතාව වර්ධනය කිරීම, ඒ සඳහා අදාළ නීති රීති සංශෝධනය කිරීම.
- ස්ථාවර මූලාශ්‍රවලින් සිදුවන වායු දූෂණය අවම කිරීමට කටයුතු කිරීම, ඒ සඳහා විකල්ප බලශක්ති ප්‍රවර්ධනය කිරීම, ඉන්ධන දහන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, වඩා කාර්යක්ෂම ඉන්ධන භාවිතය, පිවිතුරු නිෂ්පාදන තාක්ෂණය (ඎකැ්බැර ඡරදාමපජචසදබ ඔැජයබදකදටහ) භාවිතය, වායු අපද්‍රව්‍ය පිරිපහදු කිරීම ඉහළ කාර්යක්ෂමතාවකින් සිදුකිරීම.
- ජංගම මූලාශ්‍ර තුළින් සිදුවන වායු දූෂණය අවම කිරීමට කටයුතු කිරීම, දැනට ක්‍රියාත්මක මෝටර් රථ පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම, නවීන හා දියුණු පොදු ප්‍රවාහන ක්‍රම ක්‍රියාත්මක කිරීම, ඉන්ධනවල ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීම, පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධති විද්‍යුත් හා දෙමුහුන් ප්‍රවාහන රථ ප්‍රවර්ධනය, මාර්ග තදබදය පාලනය කිරීමට ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීම.
- වායු දූෂණය අවම කර ගැනීම පිණිස සමාජයේ අවබෝධය වැඩි දියුණු කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කිරීම.

## පරිසර සුරක්ෂිතතාව සඳහා නීතිය හා සමාජ සම්මුතීන්

සමස්ත පෘථිවියම තනි පරිසර පද්ධතියක් ලෙස සැලකීමේදී ජාත්‍යන්තරව සිදුවන පාරිසරික ව්‍යසනයන් අප රටේ ඇතැම් ප්‍රදේශවලට දැඩිව බලපාන්නකි. විශේෂයෙන් වායු දූෂණයත්, නාවික ගමනා ගමනයේදී සිදුවන පාරිසරික දූෂණයත්, සාගර සම්පත් පරිහරණයේ දී ඇතිවන ගැටලු ආදියත් නිරාකරණයේදී හා වන්දි ලබාගැනීමේදී රටේ වගකිවයුතු නිලධාරීන්, ඇමතිවරුන් ඇතුලු රටේ නායකයන්ට ඒ හා අදාළ ගිවිසුම් හා ප්‍රඥප්තීන් පිළිබඳව ඇත්තේ අඩු අවබෝධයක් බව පසුගිය සිදුවීම් අනුව පැහැදිලිය. එමෙන්ම රටට වාසි සහගත ලෙස ඒවා රටේ නීති පද්ධතියට එක්කර නොතිබීම හේතුවෙන් විවිධ ගැටලු රාශියක් පැනනැගී තිබේ. එමෙන්ම රටේ සියයකට අධික වූ පාරිසරික පනත්වල ඇති දුබලතාවන් නීතිය ක්‍රියාත්මක වීමේදී විශාල බාධාවක් වී තිබේ.

## ක්‍රියාමාර්ග

- පරිසර සුරක්ෂිතබව තහවුරු කිරීම උදෙසා දැනට පනවා ඇති අණපනත්හි දුර්වලකම්, අඩුපාඩු, ඌනතාවයන් ඉවත් කිරීම උදෙසාත්, අවශ්‍ය නව පනත් සම්පාදනය උදෙසාත්, ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත කොමිසමක් ස්ථාපිත කිරීම.
- නව අණපනත් සකස් කිරීමේදී ජාත්‍යයන්තරය සමග එලඹ තිබූ ගිවිසුම් හා ප්‍රාඥප්තීන් පිළිබඳ අවධානය යොමුකර ඉන් ගතයුතු වැදගත් කරුණු රටේ පාරිසරික සුරක්ෂිතතාව වෙනුවෙන් අන්තර්ග්‍රහණය කිරීම.
- සම්මත කරගනු ලබන පාරිසරික අණපනත් හා ප්‍රඥප්තීන් පිළිබඳව රාජ්‍ය, පෞද්ගලික ආයතන සහ මහජනතාව සඳහා පුළුල් අවබෝධයක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීමග

## විවිධ ජෛව පරිසර පද්ධති

රට තුළ පවතින භූ විෂමතාවත්, අපට හිමි වර්ෂාපතනයේ ව්‍යාප්තියත් අනුව සුවිශේෂ පරිසර පද්ධතීන් කිහිපයක් පවතීග ඒ නිසාම විශාල ජෛව විවිධත්වයක් ද හඳුනාගත් සුපුෂ්පික ශාක විශේෂ 3150 (ආවේණික 894) ක් ද, හඳුනාගත් සත්ව විශේෂ 972 (ආවේණික 330) ක් ද, ශ්‍රී ලංකාව සතුය. ලොව

දැකිය හැකි වනාන්තර වර්ග බොහොමයක් දැකිය හැකිවුවත් ඒවායේ පාරිසරික වටිනාකම් පිළිබඳව ප්‍රමාණවත් තක්සේරුවක් සිදුකර නොමැත. මේ හෙයින් මෙම පරිසර පද්ධති විනාශවීම හා පටුවීම හේතුවෙන් රටේ පාරිසරික තුලිතතාවයේ විකෘතීන් මතුව තිබේ.

## ක්‍රියාමාර්ග

කඳුකර බිම්

- ආර්ථික හා සමාජීය කටයුතු සඳහා කඳුකර වනාන්තර භාවිතයට ගැනීම නියාමනය කිරීම.
- කඳුකර පරිසර පද්ධති සමාලෝචනය කර ඒකාබද්ධ දත්ත පද්ධතියක් සැකසීම සහ ඒවායේ පාරිසරික හා ආර්ථික වැදගත්කම හඳුනාගැනීම හා අවධාරණය කිරීම.
- විවිධ හේතුමත පාඩු ලබන කඳුකර වතු වගාවල වියදම් හා ප්‍රතිලාභ විශ්ලේෂණයක් (Cost Benefit Analysis) හා පාරිසරික විගණනයක් මගින් වගාව තවදුරටත් පවත්වාගෙන යන්නේද වෙනත් ආදේශක වගා සිදුකරන්නේද නැතහොත් ස්වාභාවික වනාන්තර වර්ධනය කරන්නේද යන්න තීරණය කිරීම.

පහත් බිම්

- ඉඩම් භාවිත කිරීමේ ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූලව සියලු ඉඩම් කළමනාකරණය කිරීමේ හා සංරක්ෂණය කිරීමේ කටයුතු සිදුකිරීම.
- ස්වාභාවික විපත් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේද හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම, වන්දි හා රක්ෂණ ක්‍රම හඳුන්වාදීම.
- ප්‍රජා වන වගා, වැවිලි වන වගා හා කෘෂි වන වගා ප්‍රවර්ධනය කිරීම සහ දැනට පවතින වන වගාවන් වැඩි දියුණු කිරීම.

තෙත්බිම්

- ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය සමාලෝචනය කරමින් තෙත්බිම් සංරක්ෂණයට අවශ්‍ය පියවර ගැනීම.
- රම්සා තෙත්බිම් ලෙස හඳුනාගෙන ඇති හා ඉදිරියේදී හඳුනාගනු ලැබිය හැකි රම්සා තෙත් බිම් සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම සහ ඒ මගින් සංචාරක ආකර්ෂණය ලබා ගැනීම.
- බහුපාර්ශ්වීය හවුල්කරුවන් හා ප්‍රජා සහභාගිත්වය සහිතව, හායනයට ලක්වූ තෙත්බිම් ප්‍රතිෂ්ඨාපනය කිරීම.
- ඒකාබද්ධ තෙත්බිම් කළමනාකරණ කටයුතු සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.
- තෙත්බිම් තුළට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීමට අවශ්‍ය නීතිරීති හඳුන්වා දීම.
- ඒකාබද්ධ තෙත්බිම් කළමනාකරණ කටයුතු සැලසුම් කිරීම සඳහා සහභාගිත්ව ඒකාබද්ධ ඉඩම් පරිහරණ සහ ජලසම්පත් කළමනාකරණ සැලසුම් හා අන්තර් ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.
- හායනයට පත් වූ තෙත්බිම් බහු පාර්ශ්වික හවුල්කරුවන් හා ප්‍රජා සහභාගිත්වය සහිතව ප්‍රතිස්ථාපනය කිරීම.

කඩොලාන

- කඩොලාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කර ක්‍රියාවට නැංවීම.
- කඩොලාන පරිසර පද්ධතිවල පාරිසරික වශයෙන් පවතින වැදගත්කම අනුව ඒවායේ රැකවරණය සඳහා නීතිමය පියවර ගැනීම.

වනාන්තර හා වනජීවී

- ඒකාබද්ධ කළ හැකි වනජීවී හා වනසංරක්ෂණ කලාප හඳුනාගෙන වනජීවී කලාප තුළ නව මංකඩවල් ස්ථාපිත කිරීම.
- අලි ඇතුන්ගේ ඇත්දළ, ගජ මුතු, කෙළි හා වෙනත් සත්ව කොටස් සම්බන්ධව මිථ්‍යා විශ්වාස හා ඒවාට ලබාදී ඇති අනවශ්‍ය මූල්‍ය වටිනාකම් අහෝසි කිරීම සඳහා ජන අවබෝධය ලබාදීම.

- වන අලි මිනිස් වාසස්ථානවලට පිවිසීම වැළැක්වීම සඳහා විදුලි වැට පද්ධති ස්ථාපිත කර, විදුලි වැට නඩත්තු කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව ඒකක පිහිටුවීම.
- අලි මිනිස් ගැටුම පාලනය සඳහා දැනට ඇති නෛතික හා ආයතනික ව්‍යුහයන් සමාලෝචනය කර ප්‍රජා සහභාගිත්වය සහිත අන්තර් ආයතනික කළමනාකරණ ප්‍රවේශයක් අනුගමනය කිරීම.
- සියලු වන සතුන්ගේ ආහාර හා ජල අවශ්‍යතා සැපිරීමට අදාළ පාරිසරික පද්ධති සුපෝෂණය කිරීම.
- මහජන සහභාගිත්ව ප්‍රවේශ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් වැව්වල පෝෂක ප්‍රදේශ වනාන්තර ලෙස පවත්වා ගෙනයාම හා ආක්‍රමණික ශාක ඉවත් කිරීම.
- අලි මිනිස් ගැටුම පාලනය කිරීමට වන අලි ගහනය, සංචරණ රටා හා වාසස්ථාන පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදුකර, ජීව විද්‍යාත්මක හා නව තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ජන සහභාගිත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මොනරුන්, රිලවුන් , දඬු ලේනුන් වැනි වගාවන්ට හානි පමුණුවන වන සතුන්ගේ වර්ධනය පිළිබඳව නිවැරදි අධ්‍යයනයක් සිදුකර, ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් ගහණය පාලනය කිරීමට පියවර ගැනීම.
- ජෛව විවිධත්වයේ විතැන් සංරක්ෂණ (Ex-situ Conservation) පහසුකම් වැඩි දියුණු කිරීම මගින් මහජනතාවට විනෝදාස්වාදය හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය හා අධ්‍යාපනික පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය පහසුකම් සැලසීම.
- සත්ව හා ශාක විශේෂවල ස්ථානීය සංරක්ෂණ (In-situ Conservation) පහසුකම් වැඩි දියුණු කිරීම.
- ස්වාභාවික වනාන්තර ආවරණය පරිසර සේවා පවත්වාගෙන යෑමට හැකිවන පරිදි කළමනාකරණය කිරීම හා සංරක්ෂණය කිරීම.
- ආක්‍රමණකාරී ආගන්තුක ජීවී විශේෂ රට තුළට ඇතුලුවීම පාලනය කිරීම හා දැනට ව්‍යාප්තව පවතින ආක්‍රමණකාරී ආගන්තුක ජීවී විශේෂ තව දුරටත් පැතිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.

## පාරිසරික යහපැවැත්ම තහවුරු කිරීම

එක් එක් පරිසර පද්ධතිවල කාර්යභාරයත්, ඒවා වෙනත් පරිසර පද්ධති සමඟ ඇති පෙනෙන හා නොපෙනෙන අන්තර් සම්බන්ධතාවයත්, නිවැරදිව තක්සේරු නොකිරීම හේතුවෙන් ඒවා විනාශවන හෝ හැකිළීමට ඉවහල්වන තීන්දු තීරණවලට එලඹේ. මේ හේතුවෙන් එක් පරිසර පද්ධතියක් විනාශවන විට ඒ හා අන්තර් සම්බන්ධිත තවත් පරිසර පද්ධති විශාල ප්‍රමාණයක පැවැත්ම අර්බුදයකට ලක්වේ. එමෙන්ම විශාල ආර්ථික ප්‍රතිලාභයක් අත්කර ගත හැකි පරිසර පද්ධතීන් හා එහි ඇති සංඝටකයන් නොදැනුවත්වම විනාශයට ලක්වේ.

## ක්‍රියාමාර්ග

- පරිසර පද්ධති අතර පවතින අන්තර් සම්බන්ධතාව අනාවරණය කිරීම සඳහා සිදුකෙරෙමින් පවතින පර්යේෂණ තවදුරටත් දිරිගැන්වීම, නව පර්යේෂණ සඳහා දිරිගැන්වීම.
- පරිසර පද්ධති අතර පවතින අනුලෝම හා ප්‍රතිලෝම සම්බන්ධතාවන් අනාවරණය කිරීම සහ අවදානම අවම කිරීම සඳහා පියවර ගැනීම.
- ජාන මංකොල්ලය සඳහා සිදුවන විදෙස් මැදිහත්වීම් උපරිමයෙන් සීමා කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම.
- අන්තර් පාරිසරික පද්ධතිවල පවතින ශාඛ හා සත්ව ජාන පිළිබඳව පර්යේෂණ සිදුකොට අන්තර්ජාතික පර්යේෂණ සඟරාවල පලකිරීම, ඒ හා අදාළ නිපැයුම් සඳහා පේටනට් බලපත් ලබාගැනීමට පහසුකම් සැපයීම සහ ඒ ඒ පරිසර පද්ධතිවල ඇති ශාඛ හා සත්ව ජාන දත්ත පද්ධතියක් පවත්වා ගෙනයාම.
- මෙරටට ආවේණික ජාන භාවිතයෙන් විදේශීය රටවල් ලබාගෙන ඇති පේටන්ට් බලපත්‍රවල දේශීය නිෂ්පාදන සිදුකිරීමේ අයිතිය  ලබා ගැනීම සඳහා කටයුතු කිරීමග
- විවිධ පරිසර පද්ධති අතර පවතින අන්තර් සම්බන්ධතාවන් පිළිබඳව ද පරිසර පද්ධති හා මානව ප්‍රජාව අතර පවතින සහසම්බන්ධතාව පිළිබඳව ද අධ්‍යනය කෙරෙන  පර්යේෂණ ආයතනයක් ස්ථාපිත කිරීම.

- ලෝකයේ පවතින නවතම සංචාරක ප්‍රවණතාවන්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ශ්‍රී ලංකාව සතු ආකර්ෂණීය පරිසර පද්ධති සුරක්ෂිත කිරීම, උපරිම ඵලදායිතාවයෙන් යුතුව භාවිත කිරීමේ තිරසර ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ ඒ සඳහා අවශ්‍යකරන යටිතල පහසුකම් ගොඩනැගීම.
- පරිසරයේ විවිධ ක්ෂෙත්‍ර අතර පවතින අන්තර් සම්බන්ධතාවන් සහ වටිනාකම් හඳුනාගත හැකි ජන සමාජයක් නිර්මාණය කිරීම සඳහා ළදරු වයසේ සිට විධිමත් සහ අවිධිමත් පරිසර අධ්‍යාපන ක්‍රමවේදයන් හඳුනා ගැනීම හා ක්‍රියාවට නැංවීම.

## ගෙවතු ආශ්‍රිත සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකාව සතු ගොඩබිම්, සාගරය සහ වායු නියෝජනය කරන සියලු පාරිසරික පද්ධතිවල සුරක්ෂිතාවට මැදිහත්වීම ප්‍රජාවගේ වගකීමක් වේ. බොහෝ පුරවැසියන්ගෙන් පරිසර පද්ධතිවල සුරක්ෂිතාව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ මනෝභාවය අවම වනුයේ ඔවුන් තම ගෙවත්ත තුළ වර්ධනය හෝ සංවර්ධනය කරනු ලබන පාරිසරික සම්පත් භුක්ති විඳීමේදී දැඩි නීති පද්ධතියකින් අවහිර කිරීම නිසාය. එසේ වනුයේ එය පුරවැසියාට අයත් නොවන සම්පතක්ය යන ආකල්පය නිසාවෙනි. මේ නිසා පරිසර පද්ධතිවල සුරක්ෂිතතාව ප්‍රවර්ධනයට ගෙවතුවලින් ලැබෙන දායකත්වය වඩා සක්‍රීය කරමින් පරිභෝජනය පහසු කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වාදිය යුතුව තිබේ. එමෙන්ම ගෙවතු උද්‍යාන පවත්වා ගැනීමේදී සහ නඩත්තු කිරීමේදී උපරිම පාරිසරික වාසි සහ ආර්ථික වාසි අත්වන ආකාරයට පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කරන නීතිමය ප්‍රතිපාදන හඳුන්වාදීම හා භාවිතයට ගැනීම සිදුවිය යුතුය. ගෙවතු ආශ්‍රිතව ඇති ස්වාභාවික තෘණමය හා වෘක්ෂලතාවන්ගේ මෙන්ම වගාවන්ගේ නිසි නඩත්තුවක් නොමැතිවීම පරිසර අලංකරණයට බාධාවක්වී ඇත. එමෙන්ම ආර්ථික භෝග මෙන්ම අලංකරණ වෘක්ෂලතාවලට වැළදෙන විවිධ වූ රෝග පැතිරීම, ආර්ථිකව මෙන්ම පරිසර පද්ධතිවල පැවැත්ම අභියෝගකට ලක්කරන අවස්ථාවන් බහුලය.

## ක්‍රියාමාර්ග

- ගෙවතු ආශ්‍රිතව ඇති පස්, නිවෙස් ඉදිකිරීම් සඳහා භූමිය සකස් කිරීමේදී වැඩි පස් ඉවත් කිරීම, නිවසක අත්තිවාරම් පිරවීම සඳහා පස් ලබාගැනීමේ ක්‍රියාකාරකම් සඳහා ලිහිල් නීති යටතේ අවසර ලබාදීම.
- දැව අපේක්ෂාවෙන්ම ගෙවත්තේ වගා කළ ගසක් කපාගැනීම සහ ප්‍රවාහනය සඳහා ලිහිල් නීතිරීති යටතේ අවසර ලබාදීම.
- ගෙවතු ආශ්‍රිතව මතුපිට සම්පත් පරිහරණයේදී සංරක්ෂණයට ප්‍රමුඛත්වය දෙන හා පහසු ක්‍රමවේද හඳුන්වා දීම.
- ගෘහ ආශ්‍රිත ශාක සහ සත්ව පාලනය සඳහා පරිසර අලංකරණ නිර්ණායක හඳුන්වා දීම.

## පරිසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

අසංවිධිත සංවර්ධන සැලසුම් හා නූතන ජීවන රටාවේ සංකීර්ණ බවත්, ලාභ ඉපැයීම මූලික අරමුණ කරගත් ආර්ථික ක්‍රියාවලියත්, හේතුවෙන් ලංකාවේ දෛනික කසළ ජනනය මෙට්‍රික් ටොන් 7000 කට ආසන්නව පවතී. ජලය, වායුව, පස දූෂණය වී පාරිසරික, ආර්ථික, සෞඛ්‍යමය, සමාජයීය ගැටලු මෙතුළින් නිර්මාණය වීම පවිත්‍ර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමේදී අභියෝගයක් ලෙස අප හඳුනා ගනිමු.

## ක්‍රියාමාර්ග

- ගෘහස්ථ, සේවා සම්පාදන, කෘෂිකාර්මික හා කාර්මික වැනි සියලු අංශයන්හි ජනනය වන කසළ උචිත පරිදි ශූන්‍ය අපද්‍රව්‍ය සංකල්පය, 3ඍ (ජනනය අවම කිරීම, නැවත භාවිතාව, ප්‍රතිචක්‍රීකරණය) සහ චක්‍රීය ආර්ථික කළමනාකරණ සංකල්ප මත පදනම්ව ප්‍රජාව සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව ප්‍රවේශයකින් කළමනාකරණයට අවැසි ලෙස නෛතික රාමුව යාවත්කාලීන කිරීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඊට සෘජුව අදාළ වන අනෙකුත් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කර ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම.

- ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික ඥානය, පුහුණු මානව සම්පත, ආයතනික හා මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද හා පාර්ශ්වකරුවන් සහසම්බන්ධ කර ගැනීමේ යාන්ත්‍රණය ආදිය මගින් පළාත් පාලන ආයතන සවිබලගැන්වීම.
- නිසි කසළ කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීමට පුද්ගල වගකීම් හා ආකල්ප පිළිබඳව නිරතුරුව දැනුවත් කිරීම.
- නිසි කසල කළමනාකරණ සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සහිතව සියලු නිවස්න කලාප, මහල් නිවාස, සේවා, කාර්මික ඉදිකිරීම් හා සංවර්ධන වැඩ සටහන් සම්පාදනය කිරීම.
- නව නීති, ආදේශන හඳුන්වාදීම්, මූල්‍ය හා වෙනත් දිරිගැන්වීම් හා විස්තීර්ණ නිශ්පාදක වගකීම් (Extended Producer Responsibilities) ක්‍රමවේද මගින් ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය අවම කිරීම, සායනික හා අන්තරායකාරී අපද්‍රව්‍ය නිසි කළමනාකරණය හා සුරක්ෂිතව අවසන් බැහැර කිරීම සිදුකිරීම සහ විද්‍යුත් අපද්‍රව්‍ය මගින් සම්පත් නිස්සාරණය හා අපනයනය සැලසුම් සහගතව සිදු කිරීම.
- නවීන තාක්ෂණික ක්‍රම සහිත අවසන් කසළ බැහැර කිරීම, කසළ මගින් බලශක්ති උත්පාදනය සහ කසළ මගින් සම්පත් නිස්සාරණය කිරීම සඳහා යටිතල පහසුකම් සම්පාදනය කර පවත්වාගෙන යෑම.
- ශූන්‍ය අපද්‍රව්‍ය ක්‍රමවේදය යටතේ කර්මාන්ත ඉදිකිරීම සඳහා අනුග්‍රහය ලබාදීම හා සෑම කර්මාන්තයක්ම හැකි සෑමවිටම කර්මාන්ත කලාප තුළ ස්ථානගත කිරීම.

## පරිසර පද්ධති අතර සම්බන්ධකම් හා වටිනාකම්

ජෛව විවිධත්වය තුළ එක් එක් ප්‍රපංචයන්ගේ පාරිසරික කාර්යභාරයත්, ඒවායේ ජානමය වටිනාකම් පිළිබඳවත්, පර්යේෂණ සිදුකිරීම තුළින් ඒ පිළිබඳව පවතින දැනුම පුළුල් කළ යුතුව තිබේ. ඒ සඳහා දැනට ක්‍රියාත්මක ආයතන බහුවිධ ඉලක්ක සහිතව විවිධ ස්ථානවල ස්ථාපිතව ක්‍රියාත්මක වීම නිසා කාර්යක්ෂමතාවෙහි ඌනතාවන් හඳුනාගත හැකිය.

## ක්‍රියාමාර්ග

- පරිසර පද්ධතිවල අන්තර් සම්බන්ධතාවන් අනාවරණය කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම. මෙම පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා විශ්වවිද්‍යාල ඇතුලු සියලු පර්යේෂණ ආයතන ඒකාබද්ධව මෙහෙයවීමග
- එකම විෂයපථයකට අයත් ආයතන (වන සංරක්ෂණ, වන ජීවී, දැව, මධ්‍යම පරිසර, සමුද්‍ර දූෂණ ආදී) ඒකාබද්ධ යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මකවන පාලන ව්‍යුහයක් ඇති කිරීම.
- පරිසර සංරක්ෂණය සඳහා ප්‍රජාව පෙළගැස්වීම උදෙසා ආකල්ප, දැනුම, චර්යාධර්ම, සමාජ වටිනාකම්, ජාතික වගකීම් හා වගවීම්, සම්ප්‍රදායන්වලින් සන්නද්ධ කිරීම සඳහා ජාතික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සංවේදී පරිසර පද්ධතිවල පදිංචිකරුවන් එම පරිසර පද්ධතිවල කොටස්කරුවන් ලෙස පවත්වා ගැනීම, වන සම්පත් ජීවිකාව සඳහා භාවිත කිරීමේදී අදාළ පරිසර පද්ධතියට සිදුවන හානි අවමවන ලෙස අවස්ථාව ලබාදීමත් හා අදාළ ක්‍රියාකාරකම් වර්ධනය නොවීමට දිරිගැන්වීම සිදුකිරීම.
- පරිසර පද්ධති අතර අනුලෝම හා ප්‍රතිලෝම සම්බන්ධතා මෙන්ම මානව සම්බන්ධතා අනාවරණය කිරීමට අවශ්‍ය පර්යේෂණ හා අධ්‍යයනයන් සිදුකිරීම.
- පරිසර පද්ධති පිළිබඳ පර්යේෂණ සිදුකිරීම, පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම හා පේටන්ට් අයිතිය ලබාගැනීම.
- සංචාරක කර්මාන්තය සඳහා ශ්‍රී ලංකාව තුළ දසත විසිරී ඇති ආකර්ෂණීය පරිසර පද්ධති සුරක්ෂිත කිරීම.

2024 අගෝස්තු 31

https://www.akd.lk

# පොහොසත් රටක් ලස්සන ජීවිතයක්

"

මහා ගංගා, අහසට දෑත් දිගු කළ විශාල කඳු පංති, නොඉඳුල් වනාන්තර ඇතුළු සොබාදහම අපට නිර්මාණය කළ නොහැකිය. අහසින් ගලා හැලෙන දිය බිඳු, මිහිමත නිර්මාණය වූ සත්ත්ව ප්‍රජාව, වසර දහස් ගණනක් අපගේ මුතුන් මිත්තන් පා සටහන් තැබූ මිහිමව, සොබාදහමේ සිසිල හා අසීමිත සොභාවික සම්පත් අපට කෙසේවත් නිර්මාණය කළ නොහැකි හෙයින් නිර්මාණය කළ නොහැකි දේ අප රැකගත යුතුව ඇත.

**ඔස්කාර් වයිල්ඩ්**

"

ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

+94 112 785612
464/20, Pannipitiya Road, Pelawatta, Battaramulla, Sri Lanka.